# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2327/04 - 2023 අප්‍රේල් මස 11 වැනි අඟහරුවාදා - 2023.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී - 94/47(VIII)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) සහ 21(2)(ආ) වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින් -

(*අ*) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "කිරිමැටියාන ශ්‍රී සුධම්මවංශාරාම මහා විහාරය" යනුවෙනු හඳුන්වනු ලබන භූමි ප්‍රාදේශය, නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට පත් කරනු ලැබේ; සහ

(*ආ*) නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ඉහත ප්‍රකාශයට පත් කරනු ලැබූ "කිරිමැටියාන ශ්‍රී සුධම්මවංශාරාම මහා විහාර භූමි ප්‍රදේශය" සම්බන්ධයෙන් පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධානය කරනු ලැබේ.

**ප්‍රසන්න රණතුංග,**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 මාර්තු මස 27 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***කිරිමැටියාන ශ්‍රී සුධම්මවංශාරාම මහා විහාර භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, දන්කොටුව ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු පිටිගල් කෝරලය සුළු කොට්ඨාසයේ, කිරිමැටියාන ග්‍රාමයේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ 2020 ජනවාරි මස 15 දිනැති අංක PU/DSO/2019/414 දරන අනුරේඛනයේ කැබලි අංක "ඒ" දරන විහාරවත්ත දෙල්ගහහේන තේක්කවත්ත පිංකුඹුර නමැති ඉඩමේ හෙක්ටයාර් 7.6804ක් විශාලත්වයෙන් යුක්ත පහත මායිම් වූ බිම් ප්‍රදේශය :

1A - G 39319 — 16 (2023/04)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**කැබලි අංක ඒ - විහාරවත්ත දෙල්ගහහේන තේක්කවත්ත පිංකුඹුර**

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ගය, මාලනී චන්ද්‍රකීර්ති හිමිකම් කියන තේක්කවත්ත, සුහසිංහ ජිනරත්න හිමිකම් කියන බෝගහඕවිට, සුහසිංහ ජිනරත්න හිමිකම් කියන උස්වත්ත කුඹුර, කන්දේවත්ත සහ ප්‍රාදේශීය සභා මාර්ගය |
| *නැගෙනහිරට* | : | ප්‍රාදේශීය සභා මාර්ගය සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය |
| *දකුණට* | : | පළාත් මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය |
| *බටහිරට* | : | පළාත් මාර්ග සංවර්ධන අධිකාරි මාර්ගය, මාර්ගය, මාලනී චන්ද්‍රකීර්ති හිමිකම් කියන තේක්කවත්ත සහ සුහසිංහ ජිනරත්න හිමිකම් කියන බෝගහඕවිට |

EOG 04 -0078

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.